


**ශ්‍රී. බු. ව. 2560 ක්වූ ඇසළ මස කලාපය, රා. ව. 2016 කවූ ජූලි මස 19 වන දින**

මාතර, ශ්‍රී සුදර්ශි විද්‍යායතන නියෝජ්‍ය පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති

ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# තාවකාලික මිනිස් සිරුර පවත්වාගෙන යාමට නරක කර්ම නොකරමු.

ගරු ස්වාමීන් වහන්ස, කාරුණික පින්වත්නි,

අචිරංවතයං කායො - පඨවිං අධිසෙසසති

ඡුදෙධා අපෙත විඤඤණො - නිරත්‍ථංව කළිඞගරං

( ධමම පදය - චිතත වගගය )

" මේ කය ඒකාන්තයෙන් නොබෝකලකින් පහවූ සිත් ඇත්තේ බැහැරලන ලද්දේ වැඩක් නැති දිරා ගිය දරකඩක් සේ පොළව මතුපිටට වැටෙන්නේය."

අද ඇසළ පුර පසළොස්වක පොහොය දිනයයි. ශාසන ඉතිහාසය තුළ මෙම පොහොය දිනයෙහි වැදගත් සිදුවීම් රාශියක් සිදු වී තිබේ.අප මහා බෝසතාණන්වහන්සේ මව් කුස පිළිසිඳ ගත්තේද, සතර පෙර නිමිති දැක අභිනිෂ්ක්‍රමණය කළේද, දම්සක් පැවතුම් සූත්‍රය දේශනය කළේද, රාහුල කුමරුගේ උපත සිදු වීමද, බුදුරජාණන් වහන්සේ ගණ්ඩම්බ රුක මුල හිඳ තීර්ථකයින්ගේ මානය නැති කිරීම සඳහා යමා මහා ප්‍රාතිහාරය පෑමද, තව්තිසා දෙව් ලොවට වැඩමවා මාතෘ දිව්‍යරාජයාට අභිධර්මය දේශනා කිරීම ආදී වැදගත් කරුණු රාශියක් සිදුවූයේ අද වැනි පුර පොහොය දිනයකය. උපසම්පද භික්ෂූන් වහන්සේලා වස් විසීමේ චාරිත්‍රය ඉටු කරන්නේද ඇසළ පොහෝ දිනයේදීමය.

එවන් වැදගත් දිනයක මෙම සදහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ අපට අයිතිව තිබෙන තාවකාලික මිනිස් සිරුරේ ස්වභාවය නුවණින් තේරුම් ගෙන නරක කර්ම වලින් ඈත්ව හොඳ කර්ම කිරීමට උපදෙස් දීමයි. මේ සඳහා අප යොදා ගන්නේ ධම්මපදයේ චිත්ත වර්ගයේ සඳහන් වන ඉහත සඳහන් ගාථාවයි. මෙම ගාථාව බුදුන් වහන්සේ දේශනා කළේ පූතිගත්ත තිස්ස හිමියන් නිමිති කර ගෙනයි.

සැවැත් නුවර ජීවත් වූ එක් කුල පුත්‍රයෙක් බුදුරජාණන් වහන්සේගෙන් බණ අසා පැවිදිව උපසම්පදාවී තිස්ස නමින් ප්‍රසිද්ධව ජීවත් විය. කලක් ගත වූ පසු තිස්ස හිමියන්ගේ ශරීරයෙහි රෝගයක් හට ගත්තේය. මුලින්ම තිස්ස හිමියන්ගේ සිරුරෙහි අබ ඇට තරම් බිබිලි ඇති විය. ඒ බිබිලි ක්‍රමයෙන් බෙලි ගෙඩි තරම් විය. එම ගෙඩි පැලී ගොස් මුළු ශරීරයම සැරවයෙන් තෙමී ගිය තුවාලයක් බවට පත් විය. ඒ නිසාම ඒ හිමියන් පූතිගත්ත තිස්ස හිමියන් යනුවෙන් හැඳින්වූහ. බුදුරජාණන්වහන්සේ මහා කරුණා සමාපත්තියට සමවැදී ලොව බලන විට අසරණව සිටින ඒ හිමියන් දුටු සේක. තථාගතයන් වහන්සේ එතනට වැඩම කොට වතුර උණු කොට තිස්ස හිමියන්ගේ සිවුරු සෝදා ශරීරය සුවපත් කොට පූතිගත්ත තිස්ස හිමියන්ට දේශනා කළේ මේ මිනිස් සිරුරේ ඇති නිසරු බව ගැනයි. මේ මිනිස් සිරුර පවතින්නේ ඉතා කෙටි කාලයකි. මේ සිරුරෙන් විඤ්ඤාණය පහවූ කල්හි වැඩකට නැති දරකඩක් සේ මේ පොළව මත වැටෙන්නේය. මෙම අනිත්‍ය ප්‍රතිසංයුක්ත දේශනාව ඇසූ පූතිගත්තතිස්ස හිමියන් සියලු කෙලෙස් නසා රහත් භාවයට පත්ව මේ සසර දුක කෙළවර කළහ.

පූතිගත්තතිස්ස හිමියන්ගේ ජීවිතය කෙළවරවනු දුටු භික්ෂූන් වහන්සේලා බුදුන් වහන්සේගෙන් ඇසුවේ තිස්ස හිමියන් ගේ ඊළඟ උපත කොතනක සිදු වුණාද යන්න ගැනය. එහිදී බුදුන් වහන්සේ දේශනා කළේ පූතිගත්තතිස්ස හිමියන්රහත් වූ නිසා ඊළඟ උපතක් නැති බවය. රහත් වීමට තරම් වාසනා ගුණයක් තිබූ මේ තිස්ස හිමියන්ට මෙවැනි අසාධ්‍ය රෝගයක් ඇති වුනේ කෙසේද යන්න භික්ෂූන් වහන්සේලාට ප්‍රශ්ණයක් විය. එහිදී බුදුන්වහන්සේ දේශනා කළේ මොහු පෙර භවයකදී බරපතල අකුසල කර්මයක් කළ බවයි.

පූතිගත්තතිස්ස හිමියන් කාශ්‍යප බුදුරජාණන් දවස කුරුළු වැද්දෙක්ව ඉපිද ජීවිකාව කරයි. අද අල්ලාගෙන ආ කුරුල්ලන්ගෙන් ටිකක් මරා විකුණයි. ටිකක් කෑමට ගනී. අනෙක් කුරුල්ලන් නොමරා උන්ගේ කකුල් කඩා කූඩු වලට දමා පසු දින උන්ද මරා විකුණා ජීවත් විය. මේ බරපතල අකුසල කර්මය නිසා රහත්වන ආත්ම භවයේදී පවා මෙවැනි අසාධ්‍ය රෝගයකට ගොදුරු විය. තථාගතයන් වහන්සේ මෙහිදී අපට මතක් කර දෙන්නේ තාවකාලික වූත් විඤ්ඤාණයෙන් තොරවූ පසු කිසිදු වැඩකට ගත නොහැක්කා වූත් මේ සිරුර පෝෂණය කිරීම සඳහා අධාර්මික ක්‍රියා නොකළ යුතු බවයි.

ලී කෑල්ලකින් දැව භාණ්ඩ නිෂ්පාදනය කරගත හැක. එවැනිදේකට ගත නොහැකි දර ඉන්ධන ලෙස පාවිච්චිය කළ හැක. නමුත් මේ සිරුරෙන් එවැනි වැඩක් ගත නොහැකිය. සතුන්ගේ ශරීරය ගත් විට උන් මැරුණත් එම සිරුරු වල යම් වටිනාකමක් දැකිය හැකිය. මහනුවර දළදා මාළිගයේ දන්ත ධාතූන් වහන්සේ වැඩම කරවූ රාජා නැමැති ඇතා පසුගිය කාලයක මිය ගියා. නමුත් එම සිරුරේ පුළුන් පුරවා කාමරයක තබා තිබෙනු කාටත් දැකිය හැකිය. අපේ සිරුරෙන් විඤ්ඤාණය ඉවත් වී ගියපසු එසේ පුළුන් පුරවා බිත්තියකට හේත්තු කර තිබෙනු කොතනකවත් දැක තිබේද? ඇතා මිය ගිය විට උගේ හක්ක තබා ගෙන කම්මුල්ගාය නැමැති රෝගයට උරච්චි කර ගෑම පැරණි අයගේ සිරිතකි. නමුත් අප මැරුණු පසු අපේ හක්ක එසේ උරච්චි කර ගානු දැක තිබේද? කොටියා මළ පසු උගේ දත් සමහරු කරේ එල්ලාගෙන තිබේ.අපේ දතක් වැටුනොත් අතින්වත් අල්ලන්නේ නැත. කොළ කෑල්ලකින් අල්ලා පසකට දමයි. මේ උදාහරණ වලින් පෙන්නුම් කළේ අපේ මිනිස් සිරුරට වඩා සතුන්ගේ සිරුරු මළත් වටිනා බවයි. එසේ නම් මෙවැනි නොවටිනා සිරුරක් පෝෂණය කිරීම සඳහා අධාර්මික ක්‍රියා කරන්න එපා යන්න බුදුන්වහන්සේගේ අනුශාසනාවයි. පූතිගත්තතිස්ස හිමියන් පෙරභවයක ඉහතකී අකුශල කර්මය කළේ තම ශරීරය පවත්වාගෙන යාම සඳහායි.

මේ සදහම් පණිවිඩය කියවන කුඩා දරුවන් මේ ගැන කල්පනා කළ යුතුය. අපේ ගෙවල්වල සතුන් හිර කර ගෙන සිටිනු දැකිය හැක. කූඩුවට ගිරවෙක් ගෙනත් දමා ඌට උදේට සවසට රෑට ඉතා හොඳින් සංග්‍රහ කරයි. නමුත් දරුවනේ එම ගිරවා කූඩුවේ ඉන්නේ සතුටින් නොවේ. කොතරම් රසවත් ආහාරපාන ලැබුනත් එවැනි කූඩුවල හිරවී සිටින ගිරවුන්ට වඩා ගස්වල නිදහස්ව ජීවත් වන ගිරවුන් කොතරම් ලස්සනද ඒ නිසා අපේ ගෙවල් වල එසේ සතුන් හිරකරගෙන සිටී නම් උන් නිදහස් කර උන් කැමති කෑම බීම කමින් බොමින් සතුටින් ජීවත් වීමට අවස්ථාව සලසා දෙමු. එය ඉතාම හොඳ කුසල කර්මයකි. දෙමාපියනි, ඔබේ දරුවෙක් එවැනි සතෙක් ඇති කිරීමට අවසර ඉල්ලුවොත් බැණ වදින්නේ නැතිව කරුණාවෙන් කාරණය තේරුම් කර දී එවැනි දේ නොකරන ලෙසට උපදෙස් දෙන්න. දූ දරුවනි අපේ ගෙදර ඉස්සරහ ගසක ලෑල්ලක් සවි කර ගනිමු. එයට කුරුළු ලෑල්ල කියා නම් කරමු. එම ලෑල්ලට අපිට පුළුවන් කෑම වර්ග දමමු. එවිට කැමති කැමති කෑම වගී කන විට ඈතින් සිට ඒ සතුන් දෙස බලා සතුටු වෙමු. නූතනයේ බොහෝ ළමයින් පරෙයියන් අල්ලා ගෙන විවිධ ව්‍යාපාර කරනු දැකිය හැක. දරුවනේ එවැනි අසරණ සතුන්

අල්ලා ගෙන අප උපයන ධනය වියදම් කරන්නේ මේ තාවකාලික මිනිස් සිරුර පවත්වාගෙන යාමට නොවේද? එසේ කටයුතු කළ පූතිගත්තතිස්ස හිමිට සිදුවූ ඉරණම ගැන මොහොතක් සිතා බලන්න.

අපේ රටේ ජීවත් වන අයගෙන් එක්තරා පිරිසක් අද උන් හිටි තැන් නොමැතිව අසරණ වී තිබේ. ගෙවල් දොරවල් යාන වාහන තබාගෙන ඔවුන් සැපවත් ජීවිත ගත කරපු අයයි. නමුත් අද ඔවුන් යැපෙන්නේ රටේ අනෙක් අය ලබා දෙන අධාර උපකාර වලිනි. එම ආධාර උපකාර ගන්නා විට ඔවුන්ගේ දෑස්වලින් කඳුළු වැටෙන බව කියයි. නමුත් බලන්න සිදු වූ දේ ඒ අය මේ ආත්මයේදී නරක කර්ම නොකළ අය විය හැකිය. නමුත් පෙර භව වල මේ තාවකාලික සිරුර පෝෂණය කිරීම සඳහා නරක කර්ම කොට තිබිය හැක. එවැනි ගෙදරක දෙමාපිය දෙපලක් තම පුතා කැඳවා පුතේ ගොරවන විට වහින්න පුළුවන් ඒ නිසා කඩේට ගොස් අවශ්‍ය බඩු ටිකක් ගේන්න කියා උපදෙස් දී තිබේ. දරුවා කඩේට ගොස් ගෙදර එන විට ගෙදරත් නැත. දෙමාපියනුත් නැත. මේ දරුවා කඩේට යැව්වේ කවුද කියා කල්පනා කිරීමට කාලය උදාවී ඇත. ඒ දරුවා තම ජීවිතයේදී කරන ලද හොඳ කර්ම විසින් ඔහු ගෙදරින් පිට කළා යැයි සිතිය නොහැකිද? කර්මය ශක්තියක් ලෙසින් ක්‍රියාත්මක වෙමින් අපට කරන බලපෑම කොතරම් ද කියා මෙයින් සිතාගත හැකිය. ඒ නිසා වැඩකට නැති තාවකාලික ශරීරයක් පෝෂණය කිරීම සඳහා නරක කර්ම නොකළ යුතුය.

අපේ මේ තාවකාලික මිනිස් සිරුර ඇතුළු සියලු මානව ජීවිත සත්ව ජීවිත හා සියලු භෞතික දේ ජලයට, ගින්නට, හා සුළඟට සාධාරණය පසුගිය කාලයක සිදු වූ සුනාමි විපතේදී ජලයෙන් සිදු වූ විපත හැම දෙනාටම මතක තිබෙන අම්හිරි අත්දැකීමකි. පසුගිය දිනක කොස්ගම සාලාව නැමැති යුධ හමුදා කඳවුරේ ඇති වු ගින්න හැමෝටම සිහිනයකි. එවැනි දෙයක් සිදුවේය කියා ඒ පලාත්වල අය සිහිනෙකින්වත් සිතන්නට නැත. සමහර විදේශ රටවලට පැමිණි දරුණු සුළං වලින් මොනතරම් සත්ව සහ ශාක ජීවිත විනාශ වූවාද? මේවා ගැන සැළකිලිමත් විය යුතු කාලය උදා වී තිබේ. ඉහත කී ජලය ගින්න වාතය යනු සොබාදහමේ අපට ලැබී ඇති දායාදයෝය. නමුත් ඒවාම වරෙක අපිට විපත් සළසා දෙනු ලබන බව අමතක නොකළ යුතුය. අද බොහෝ දෙනා තාවකාලික සිරුරක් පවත්වාගෙන යාමට සොබාදහම විනාශ කිරීමට සූදානම් වී සිටිනු පෙනේ. මෙසේ අප සොබාදහමට ද්වේශ කරන විට සොබාදහමද අපිට ද්වේශ කරන බව මතක තබා ගත යුතුයි. සොබාදහමේ දායාද ලෙස පරිසරයට අලංකාර කරමින් අහිංසකව ජීවත් වූ කුරුල්ලන් මරා තම ජීවිතය ගෙන ගිය තිස්ස නම් භික්ෂුවට සිදු වූ ඉරණම ගැන කල්පනා කර බලන්න. ඒ නිසා දිවිහිමියෙන් එවැනි නරක කර්ම නොකරන්නට සිතා ගත යුතුයි. සොබාදහමින් එවැනි කරදරයක් සිදු උනොත් හොඳ කර්ම කළ අය ඒ කරදරවලින් නිදහස් වූ තැනක් හැටියට ඉහත සඳහන් කළ කඩේට ගිය දරුවා දැක්විය හැකිය.

එසේ නම් අප කාගෙත් ජීවිත වල කිසියම් ධර්ම ශක්තියක් ගොඩනගා ගත යුතුයි. බුදුදහම උගන්වන පංචසීල ප්‍රතිපත්තිය තුළ සඳහන් වන්නේ එවැනි ධර්ම ශක්තියකි. අප බෝසතාණන් වහන්සේ එක්තරා ආත්මයක වටු පැටියෙක්ව උපත ලබා කැලේ කූඩුවල දෙමාපියන් සමග ජීවත් වෙයි. ලැව් ගින්නක් හට ගෙන මුළු කැලෑවම පිළිස්සිගෙන එයි. අනෙක් සියලු සතුන් ගින්නට බියෙන් පලා යද්දී වටු පැටියාගේ දෙමාපියන් තම කුඩා දරුවා රැකගෙන සිටිති. ගින්දර කූඩුව ළඟටම එනවිට කළ හැකි දෙයක් නොවූ නිසා එම දෙමාපියන්ද දරුවා දමා ජීවිතය බේරා ගත්හ. එවිට බෝසත් වටු පැටියා මෙසේ කියයි. " මට පියාසර කිරීමට නොහැකිය. එය සත්‍යයකි. මගේ දෙමාපියන් මා හැර දමා ගියේ මට ආදරය නැති නිසා නොවේ. ඒ දෙදෙනාට වෙන කළ හැකි දෙයක් නොවූ බැවිනි. එයද සත්‍යයකි. මෙම සත්‍යයේ බලයෙන් මෙම ගින්න නිවේවායි ප්‍රාර්ථනා කළහ. " එම ලැව් ගින්න නිවී වටු පැටියාගේ ජීවිතය ගැලවුන බව වට්ටක ජාතකයේ සඳහන්වේ. මේ අපේ බෝසත් වටු පැටියා ඇති කරගෙන තිබූ ධර්ම ශක්තියයි. ජාතක පොතේ සඳහන් වන සම්බුලා ජාතකයද ධර්ම ශක්තියට හොඳ නිදසුනකි. සම්බුලා දේවියගේ ස්වාමි පුත්‍රයා වූ සොත්ථිසේන රජතුමාට වැළඳී තිබූ අසාධ්‍ය රෝගය සුව කිරීමට රාජකීය වෛද්‍යවරුන්ටද නොහැකි විය. වෛද්‍යවරුන්ගේ තීරණය අනුව රජතුමා රජකම අත්හැර කැලයට යාමට තීරණය කළ අවස්ථාවේදී සම්බුලා දේවියද රජතුමා සමග කැලයට යාමට තීරණය කළේ මවක් වැනි බිරිඳක් වූ නිසයි. නමුත් දිනක් රජු තම බිරිඳ ගැන සැක කළ අවස්ථාවේදී කෙතෙක් කරුණු කීවත් රජතුමා සතුටු කළ නොහැකි විය. එහිදී සම්බුලා දේවිය වතුර කළයක් ගෙනවුත් මෙසේ සත්‍ය ක්‍රියා කළාය. "මම යම්දිනක සොත්ථිසේන රජු සමග විවාහ ගිවිස ගත්තේද, එදා සිට අද වන තෙක් කිසිදු පිරිමියෙකු සමග සම්බන්ධ වී ක්‍රියා නොකළෙමි." එය පරම සත්‍යයකි. එම සත්‍ය බලයෙන් රජතුමාගේ මෙම අසාධ්‍ය රෝගය සුවපත් වේවායි සිතා එම වතුර කළය රජුගේ හිසට වත්කළේය. ජාතක පොතේ සඳහන් වන්නේ එම

ධර්ම ශක්තියේ බලයෙන් රජතුමා සුවපත්වූ බවයි. ඖෂධ වලින් සුව නොවූ රෝගයක් ඇල්වතුරෙන් සුවවේදැයි කෙනෙකුට ප්‍රශ්න නැගිය හැක. නමුත් කිව හැක්කේ එම ඇල්වතුර ටික ධර්ම ශක්තියෙන් යුක්ත බවයි.

අප බුදුරජාණන් වහන්සේ ඇසළ පොහොය දින දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කරමින් ලෝකයට කියා දුන්නේ ලොව පවත්නා සියල්ල නැතිවන බවයි. " යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං" යනුවෙන් දේශනා කළේ අප සකස් කිරීම සඳහායි. කෙනෙකු වටින්නේ සකස් වුනොත් පමණි. ඉහත සඳහන් ධම්මපද ගාථාවෙද අරමුණ අපේ ජීවිත සකස් කිරීමයි. එහිදී අප කල්පනා කළ යුත්තේ ඉතාම තාවකාලික මේ මිනිස් සිරුරෙන් විඤ්ඤාණය ඉවත්ව ගිය පසු මේ ශරීරයෙන් වැඩක් නැත. එවැනි සිරුරක් පවත්වාගෙන යාම සඳහා අධාර්මික දේ නොකළ යුතුයි. ආර්ය මාර්ගයේ සම්මා ආජීවය ගැන විස්තර කරන්නේ ජීවිතය පවත්වාගෙන යාම සඳහා අධාර්මික දේනොකළ යුතු බවයි. නමුත් නූතනයේ බොහෝ දෙනෙකුට පංච ශීල ප්‍රතිපත්තිය වධයක්සේ පෙනෙයි. තමාට මාසයකට ලැබෙන වැටුපට අමතරව අක්‍රමිතා කර කොතරම් ධනය උපයයිද? කාර්යාලයකින් වැඩක් කර ගැනීමට ගියොත් සමහරු ප්‍රකාශ කරන්නේ මේ වගේ වැඩ ඉක්මනින් කරන්න බැරිය කියාය. එම වැඩය ඉතා ඉක්මනින් කර දෙන සත්පුරුෂ අයද අප සමාජයේ සිටිති. නමුත් එක දවසින් ඒ වැඩේ කර ගැනීමේ ක්‍රමයද තිබේ. එසේ කරන සකස් නොවූ අය මෙසේ සිතිය යුතුය. අප මේ දේ කරන්නේ වැඩකට නැති ශරීරයක් ආරක්ෂා කර ගැනීමට නොවේද? ඒ නිසා මින් මතු මම එසේ නොකරමි. මෙම ඇසළ පොහො දින අධිෂ්ඨාන කර ගෙන නරක කර්ම නොකර හොඳ කර්ම කිරීමට උත්සහවත් වෙමු.